# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/46- 2019 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2019.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥා පනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේද* , 1951 අගෝස්තු 17 දාතම අංක 10283 ගැසට් පත්‍රයේද, 1955 මාර්තු 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේද*, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2009.10.02 වන දින අංක 1622 දරන *ගැසට් පත්‍රයේද* පළවූ බදුල්ල කතරගම දේවාලයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුවද බදුල්ල ප්‍රාදේශීය ලේකම් නිහාල් ගුණරත්න වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2019 බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

(1) 2019 අගෝස්තු මස 31 වැනි දින අළුයම කප් සිටුවීමෙන් බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වී, 2019 අගෝස්තු මස 31 වන දින සිට සැප්තැම්බර් මස 04 දින දක්වා (දින 05) අභ්‍යන්තර පෙරහැර, 2019 සැප්තැම්බර් මස 05 දින සිට සැප්තැම්බර් මස 09 දින දක්වා (දින 05) කුඹල් පෙරහැර, 2019 සැප්තැම්බර් මස 10 දින සිට 14 දින දක්වා (දින 05) රන්දෝලි පෙරහැර, 2019 සැප්තැම්බර් මස 15 දින අළුයම දිය කැපීමේ මංගල්‍යා, 2019 සැප්තැම්බර් මස 15 දින දහවල් පෙරහැර ගෙවදීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

(2) **පෙරහැරේ ගමන් මාර්ගය**

බදුල්ල කතරගම දේවාලයේ සිට බදුල්ල පහල වීදිය, පස්සර පාර (මුතියංගණ වට රවුම) ලොන්ඩන් පාර, අනගාරික ධර්මපාල මාවත, කොකෝවත්ත පාර, උදයරාජ මාවත, රජ වීදිය, කඩ වීදිය, පහළ වීදිය, බදුල්ල කතරගම දේවාලයට ගෙවදීම

(3) බදුල්ල කතරගම දේවාල භූමිය හා දේවාලයට අයත් සිංහාසනය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමිභාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

(4) පෙරහැර කාලය තුළදී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මගෙන් හෝ දේවාල භාර නිලමේ තුමාගෙන් බලපත්‍රයක් නොමැතිව දේවාල භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

(5) පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙළෙඳුන් විසින් දේවාල පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා දේවාල භූමිය තුළ පොලිතින් ඇතුළු සියළුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත්කළ යුතුය.

(6) මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

(7) කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව විසින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය.

(8) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

(9) ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 3හි දැක්වෙන කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ ආයක මුදල් එකතු කිරීම නොකල යුතුය.

නිහාල් ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම් (වැ.බ.),
බදුල්ල.

2019 ජුලි මස 25 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 355

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.